# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2011/2012**
**2014 අප්‍රේල්/මැයි/ජූනි**

**මානවශාස්ත්‍ර පීඨය**

**සිංහල - SINH E3025**

**භාෂා පරිණාමය, පුරාක්ෂර විද්‍යාව හා කලාශිල්ප**

**පළමුවන ප්‍රශ්නය ද දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි.** **කාලය : පැය 03 යි.**

## 1 කොටස

01. පහත සඳහන් පාඨයන්හි අදහස ලිහිල් බසින් ලියන්න.

(පළමු ප්‍රශ්නය සඳහා පැයක පමණ කාලයක් සෑහේ.)

i. දෙවනපිය මහරජඩ ගමිණි අබයශ පුත ලොණපි අය
ශිවශ ලෙණ ශගශ

දෙවනපිය මහරජඩහ බරියය බකි (නිය) උපශික වරුණ (දත) ය (ලෙ)ණෙ

පරුමක නමලි ශුමන පුත පරුමක නමලිය ලෙණෙ
ශගශ

පරුමක ගුත පුත පරුමක ශුමනහ ලෙණෙ අගත අනගත
චතුදිශ ශගශ

පරුමක වෙශමණ පුත බරණිය ලෙණෙ දෙවහ ච චතුදිශ
ශගශ (ලකුණු 10යි)

ii. අභිධම් දෙසුන් කසුන්
පත් අරවය් මහ පුජ කොට් සසුන් සිට්වමි යන සිත් දොල්නෙන්
ඇජර පය හමුයෙහි එ මෙ ධම්දෙසුන් වියක්

හන් කළ සිය බස්නෙන් බුද් ගුණ වැනූ රිවි අන්වයෙන් බට්
සැහැකුල කොත් ඔකා රජ්කුලට් තලාටික් අප පුරුමු-

වො තුමන් සත්ලැගු සවන හවුරුදුයෙහි අභයගිරි වෙහෙර
කපාරාමුළට් සලමෙය්වන් පවු කරය් සඟුන්

වසවය් සතර පස සුලබ්කොට් මෙමෙ නකය් අබදි අවසට් මෙ
සිරිත් තැබැවූහු අභයගිරි වෙහෙර්හි
ඉසා සෙය් ගිරි වෙහෙර්හි ඉසා බද් තුවාක් ඇත් වෙහෙර
ගම්බිමට් ඉසා මෙහි මෙ අබැදි තුවක් වෙහෙර්හි ඉසා

(ලකුණු 10 යි)

iii මෙ හොපිටිග-
-මුපදි ලද් කෙනෙකුන්
ගැත්තන් ගමට් ආ ක-
-ලැ මන්දුඩින් වණිග්‍රාම (ය*)
- න් මහාග්‍රාමයන් හිඳැ
සතලොසැ පිරිනිවිය-
-න් වහන්සෙ දවසැ
වැවස්ථා සේ පෙරෙ සිරි-
-ත් දඩ ගනුත් මිසැ අනි-
- යා නොකරනු ඉසා
ගම්ලද්දන් ගැත්තන්
මන්දුඩින් හිඳැ වි
-තාර කොට පිරිකපා
ත(බා) දුන් දඩ ගනුත්
මිසැ ගම වටා ගෙනැ
ගෙ තිරැ ගෙනැ දඩ
නොඑල්වනු ඉසා
දඩ ගැමැ නැ එ(ළ්)-
-වත් මිසැ කුඩින්
ගැමින් පිටත් කොට
නො ගෙනැ යනු ඉසා


නොපිරිකැපූ දඩට
වැලැක්මෙ නො ගන්-
-නා කොට ඉසා ලී
දඩට ස්වාමි ගිනු-
-ත් මිසැ අබුදරු
- වන් වැලැක්මෙ නො
ගන්නා ඉසා

(ලකුණු 10 යි)

iv. අත්පාවහලට් ගියාකුගෙන් දඩැ පනාස් කළ
නැක් රන් ගන්නා කොට් ඉසා නො පොහොත් (ගෙ)දඩි ගන්නා
කොට් ඉසා ගෙදඩි නැත අත් කපා පටවනු කොට් ඉසා
වූ දඩි සිහින් දඩි පෙරෙ සිරිත්සෙ ගම්ලද්දන් පමුණු
(ලද්දන් බෙදා) ගන්නා කොට් ඉසා මිවුන් ගෙරිගොන් එළු
වත් මැරුවත් මරා පටවනු කොට් ඉසා නොමරා සොරා
ගෙනැ ගිය නියත කොට් ඔවුන් ඔවුන් කසිලැ සත්ල
කුණ් ඔබා හර්නා කොට් ඉසා තිරැ නො වත් කොටා පටව
නු කොට් ඉසා බැහැරින් ඇරැ විකුණන මිවුන් ගෙරි
ගොන් එළුවන් හැන්දිනැ ඇපැ ගෙනැ ගන්නා කොට් ඉසා
අණ මැකුවන් රත්කළ යමර වැඩි(ම)ය සිටවනු කො
ට් ඉසා

(ලකුණු 10 යි)

<u>හෝ</u>
පහත සඳහන් ශිලාලිපි කියවා වර්තමාන සිංහල අකුරින් ලියන්න.



(ලකුණු 10 යි)

## 11 කොටස

02. සිංහල භාෂාවේ සම්භවය පිළිබඳ පවත්නා මතවාද සමාලෝචනය කරන්න.

03. සිංහල භාෂා විකාසය පිළිබඳ විද්වත් යුග වර්ගීකරණයන් හඳුන්වා ගයිගර්ගේ යුග වර්ගීකරණයට අනුව සිංහල ප්‍රාකෘත යුගයේ අක්ෂර මාලාවට වැඩි අවධානය යොමු කරමින් තත් යුගයේ භාෂා ලක්ෂණ පිළිබඳ විමර්ශනයක් කරන්න.

04. "ලංකාවේ බ්‍රාහ්මී අක්ෂර රූප විකාසය ස්වාධීනව සිද්ධ වූවක් නොවේ" තමන් කැමති එක් භාරතීය ආභාසයක් නිශ්‍රය කරමින් මේ ප්‍රකාශයේ සත්‍යාසත්‍යතාව පිරික්සන්න.

05. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. අශෝක බ්‍රාහ්මී අක්ෂර මාලාව
ii. ලංකාවේ ලේඛන කලාවේ ආරම්භය
iii. සිංහලය කෙරෙහි යුරෝපීය භාෂාවන්ගේ බලපෑම
iv. වේවැල්කැටිය ශිලා ලිපිය

නැතහොත්

ක්‍රි.ව. 10 වන සියවසේ මෙරට ක්‍රියාත්මක වූ වාණිජ නීතිය හා පාරිභෝගික ආරක්ෂක විධිවිධාන පිළිබඳ කිනම් තොරතුරු බදුලු ටැම් ලිපියෙන් ප්‍රකට වන්නේ දැ'යි පිරික්සන්න.

## 111 කොටස

06. ශ්‍රී ලාංකේය ශිල්ප කලා ප්‍රභවය හා විකාසය කෙරෙහි පසුබිම් වූ ඓතිහාසික සංසිද්ධි පිළිබඳ විමර්ශනයක් කරන්න.

07. බුද්ධ ප්‍රතිමාවේ ප්‍රභවය පිළිබඳ විද්වත් මතවාද සමාලෝචනය කොට, ශ්‍රී ලාංකේය බුද්ධ ප්‍රතිමා කලාවේ අනන්‍යතා ලක්ෂණ කවරේදැයි පෙන්වා දෙන්න.

08. ආවේණික ලක්ෂණ හා ශිල්ප ධර්ම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් මහනුවර යුගයේ චිත්‍රකලා සම්ප්‍රදාය පිළිබඳ ඇගයීමක් කරන්න.

09. පහත දැක්වෙන මාතෘකා අතරින් දෙකක් (02) පිළිබඳ සටහන් ලියන්න.

i. ශ්‍රී ලාංකේය බෝධිඝරය
ii. සඳකඩපහණ
iii. ශ්‍රී ලංකා ස්තූප ආකෘති
iv. සීගිරි සිතුවම්

2- 9 දක්වා ලකුණු 15 බැගිනි.

*****************************